සුවෙන් පෙරට
e ඉගෙනුම් පියස
මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

ZEOM
කලාප අධ්‍යාපන කාර්යාලය - මීනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

# ගෘහ ආර්ථික විද්‍යාව
# 11 ශ්‍රේණිය - 1 වාරය

මෙහයවීම - ස. අ .අ . (තාක්ෂණ )
M . K .A . D . අනුෂා තරංගනී මිය

සැලසුම හා මඟ පෙන්වීම - ගුරු උපදේශක (මිනුවන්ගොඩ කොට්ඨාසය)
ශ්‍රද්ධා සමරසේන මිය

පාඩම සැකසුම හා ඉදිරිපත් කිරිම - ජනාධිපති විද්‍යාලය
H. ටෙක්ලා හේමමාලි මිය

## නිපුණතාව 01 : ප්‍රසන්න ජීවන පරිසරයක් ඇති කිරීම සඳහා දායක වෙයි.

## නිපුණතා මට්ටම 1.4 : ගෘහ අභ්‍යන්තර අලංකරණය හා ගෙවත්තෙහි මනා සංවිධානය මගින් ප්‍රසන්න ජීවන පරිසරයක් ඇති කර ගනියි.

ඉගෙනුම් ඵල :

- ගෘහ අලංකරණය සඳහා උපයෝගී වන කලා මූලිකාංග හා මෝස්තර මූලධර්ම විස්තර කරයි.
- ගෘහ අභ්‍යන්තර අලංකරණය සඳහා කලා මූලිකාංග හා මෝස්තර මූලධර්ම යොදා ගනියි.
- ගෙවත්ත මනාව සංවිධානය කර ගනිමින් අලංකරණයෙහි යෙදෙයි.

H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# කලා මූලිකාංග

නිර්මාණයක් ගොඩනැගීමේ දී අත්‍යවශ්‍යයෙන් ම තිබිය යුතු දෑ කලා මූලිකාංග ලෙස හැඳින්වේ.

- රේඛා
- හැඩය
- වර්ණය
- වයනය

H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S COLLEGE

# රේඛා

නිර්මාණයක් ගොඩ නැගීමට රේඛා අත්‍යවශ්‍ය වේ. නිර්මාණයෙහි ස්වභාවය අනුව යොදා ගන්නා රේඛා විවිධ වන අතර ම රේඛා මඟින් විවිධ හැඟීම් දනවයි.


- සිරස් රේඛා
- අක්වක් රේඛා
- තිරස් රේඛා
- විකර්ණාකාර රේඛා
- වක්‍ර රේඛා

H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S COLLEGE

# සිරස් රේඛා

උස් බව, දැඩි බව, උසස් බව, සෘජු බව, ශක්තිමත් බව යන හැඟීම් ඇති කරයි.







H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S COLLEGE

# තිරස් රේඛා

තැන්පත් බව, ශාන්ත බව, නිශ්චල බව, පුළුල් බව, මිටි බව යන හැඟීම් ඇති කරයි.









H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# වක්‍ර රේඛා

සුන්දර, ප්‍රීතිමත්, සන්සුන්, සිත්කලු නැමෙන සුලු හා සියුම් බවක් වක්‍ර රේඛා තුළින් හඟවයි.








H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S COLLEGE

# අක්වක් රේඛා

අක්වක් රේඛා කලබලකාරී බව, ක්‍රියාශීලී බව චලනය, රිද්මයානුකූල බව, ලාලිත්‍යමය ස්වරූපය දනවයි.








H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S COLLEGE

# විකර්ණාකාර රේඛා

කලබලකාරී බව, නොසන්සුන් බව, ක්‍රියාශීලී බව වැනි හැඟීම් දනවයි .








H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# හැඩය

## ද්වීමාන හැඩය


දිග හා පළල දක්වන රේඛා තුළින් ද්වීමාන හැඩයක් පෙන්නුම් කරයි



## ත්‍රිමාණ හැඩය

දිග, පළල හා උස දක්වන රේඛා තුළින් ත්‍රිමාණ හැඩයක් ද පෙන්නුම් කරයි.






H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# වර්ණය


රතු , කහ, සහ නිල් යන වර්ණ තුන ප්‍රාථමික වර්ණ හෙවත් මූලික වර්ණ ලෙස හඳුන්වයි අනෙකුත් සියලු ම වර්ණ ගොඩනැගීම සඳහා උපයෝගී වන්නේ මෙම ප්‍රාථමික වර්ණ තුනයි.



H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# ද්විතීයික වර්ණ (Secondary colours)

**ප්‍රාථමික වර්ණ දෙකක් එක සමාන ප්‍රමාණවලින් මිශ්‍ර කිරීමේ දී ද්විතීයික වර්ණ සෑදේ. ද්විතීයික වර්ණ වනුයේ කොළ, දම් සහ තැඹිලි යන වර්ණ තුනයි.**







H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# අන්තර් මාධ්‍යමික වර්ණ (Intermediate colours)


ප්‍රාථමික වර්ණයක් හා ඊට යාබද ව ඇති ද්විතීයික වර්ණයක් සමාන ප්‍රමාණවලින් මිශ්‍ර කිරීමෙන් අන්තර් මාධ්‍යමික වර්ණ සාදා ගත හැකි ය. කහ තැඹිලි, රතු තැඹිලි, රතුදම්, නිල් දම්, නිල් කොළ, කහ කොළ අන්තර් මාධ්‍යමික වර්ණ වේ




H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# වර්ණ චක්‍රය (Colour wheel)

**ප්‍රාථමික, ද්විතියික හා අන්තර් මාධ්‍යමික වර්ණ ඇසුරෙන් ගොඩ නගා ගත් වර්ණ චක්‍රය.**




H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S COLLEGE

# තෘතියික වර්ණ (Tertiary Colours)

ද්විතීයික වර්ණ දෙකක් සමාන ප්‍රමාණවලින් මිශ්‍ර කළ විට තෘතීයික වර්ණ සෑදේ.

උදා :- දම් + තැඹිලි = තෘතීය රතු

තැඹිලි + කොළ = තෘතීය කහ

කොළ + දම් = තෘතීය නිල්

H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S COLLEGE

## උදාසීන වර්ණ (Neutral Colours)


වර්ණ චක්‍රයට ඇතුළත් නොවූව ද සුදු, කළු, දුඹුරු හා අළු යන වර්ණ උදාසීන වර්ණ ලෙස හඳුන්වන අතර ඒවා වර්ණ ගැන්වීමේ දී යොදා ගනු ලැබේ



H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# උණුසුම් වර්ණ හා සිසිල් වර්ණ

වර්ණ චක්‍රයේ කහ වර්ණයේ සිට රතු දම් වර්ණය දක්වා ඇති වර්ණ උණුසුම් වර්ණ වන අතර දම් වර්ණයේ සිට කහ, කොළ වර්ණය දක්වා ඇති වර්ණ සිසිල් වර්ණ ලෙසත් හැඳින්වේ.




H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S COLLEGE

# වර්ණවල ගුණාංග

- වර්ණ නාමය (Hue)
- වර්ණයේ වටිනාකම හෙවත් අගය (Value)
- වර්ණයේ තීව්‍රතාව (Intensity)

H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# වර්ණ නාමය

වර්ණයක් සුවිශේෂී ව හඳුන්වන නාමය වර්ණ නාමය ලෙස හැඳින්වේ


උදා :- නිල්, රතු, දම්




H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S COLLEGE

# වර්ණයේ අගය / වටිනාකම

වර්ණයක වටිනාකම ලෙස හඳුන්වන්නේ එම වර්ණයේ ළා හෝ තද බවයි. යම් වර්ණයකට සුදු පැහැය එකතු කිරීමෙන් විවිධ අගයන්ගෙන් යුත් ළා පැහැයන් ලබාගත හැකි ය. එමෙන්ම කළු පැහැය මිශ්‍ර කිරීමෙන් එම වර්ණයෙහි තද පැහැය ලබාගත හැකි ය







H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# වර්ණයේ තිව්‍රතාව

වර්ණයේ තිව්‍රතාව ලෙස හඳුන්වන්නේ වර්ණයක ඇති අඳුරු බව හෝ දීප්තිමත් බවය.




H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# වර්ණ ගැළපුම

වර්ණ චක්‍රයේ වර්ණ ගැළපෙන ආකාරයට යොදා ගැනීමෙන් වර්ණ ගැළපුම් ගොඩ නගා ගත හැකි ය. ඒ අනුව ගෘහ අභ්‍යන්තර අලංකරණයේ දී වර්ණ ගැළපීම පිළිබඳ විමසා බලමු.





H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# බද්ධ වර්ණ ගැළපුම

වර්ණ චක්‍රයේ ප්‍රාථමික වර්ණයක් හා ඊට යාබද ව ඇති වර්ණ දෙකක් හෝ තුනක් සම්බන්ධ කර ගනිමින් වර්ණ ගැළපීම මෙයින් අදහස් කෙරේ.







H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# වයනය

කිසියම් නිර්මාණයක මතුපිට පෘෂ්ඨය ස්පර්ශ කිරීමේ දී දැනෙන ස්වභාවය වයනය ලෙස හඳුන්වයි. දැකීමෙන් වුව ද වයනය පිළිබඳ හැඟීමක් ඇතිකර ගත හැක.





H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# 1.2 මෝස්තර මූලධර්ම

යම්කිසි ස්ථානයක හෝ භාණ්ඩයක අලංකාරය හා ආකර්ෂණය ඇති කිරීමට මෝස්තර මූලධර්ම අනුගමනය කිරීම වැදගත් වේ.

මෝස්තර මූලධර්ම ලෙස

තුලනය,

රිද්මය,

අවධාරණය,


ඒකඝත්වය

සමානුපාතය

H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# තුලනය

විධිමත් තුලනය



අවිධිමත් තුලනය




H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# විධිමත් තුලනය

හැඩයෙන්, බරෙන්, ප්‍රමාණයෙන්, මෝස්තරයෙන්, වර්ණයෙන් එකිනෙකට සමාන භාණ්ඩ කිසියම් ස්ථානයක මධ්‍ය ලක්ෂ්‍යයේ සිට දෙපසට සම දුරින් ස්ථාන ගත කිරීම විධිමත් තුලනය ලෙස හැඳින්වේ.





H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# අවිධිමත් තුලනය

කිසියම් ස්ථානයක හැඩයෙන්, ප්‍රමාණයෙන්, උසින් එකිනෙකට අසමාන ගෘහ භාණ්ඩයක් හෝ උපාංග, මධ්‍ය ලක්ෂ්‍යයේ සිට අසමාන දුරින් ස්ථාන ගත කිරීම අවිධිමත් තුලනය ලෙස දැක්විය හැකි ය. මෙහි දී බරින් වැඩි විශාල භාණ්ඩ මධ්‍ය ලක්ෂ්‍යයට ආසන්න ව ද, බරින් අඩු භාණ්ඩ මධ්‍ය ලක්ෂ්‍යයට දුරස් ව ද තැබිය හැකි ය.







H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# රිද්මය

එකම ලක්ෂණය නැවත නැවත පෙන්නුම් කිරීම මඟින් අලංකාරය ලබා දීම රිද්මය ලෙස හැඳින්වේ. ගෘහ අභ්‍යන්තර අලංකරණයේ දී රිද්මය විවිධ ආකාරයෙන් පෙන්නුම් කළ හැකි ය.

උදා:- තිර රෙදි මෝස්තර, පඩිපෙළ

H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# සමානුපාතය

කිසියම් ඉඩ ප්‍රමාණයක් තුළ ඊට සාපේක්ෂ ප්‍රමාණයෙන් යුත් ගෘහ භාණ්ඩ සහ උපාංග එම ස්ථානයේ සමානුපාතික ව තැන්පත් කිරීමෙන් සමානුපාතය ඇති කර ගත හැකි ය.





H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# අවධාරණය

**කිසියම් ස්ථානයක ප්‍රමුඛ ව පෙන්නුම් කරන ලක්ෂණයක් තුළින් පුද්ගලයෙකුගේ සිත ක්ෂණික ව එය කෙරෙහි ඇද ගන්නා ආකාරයට සකස් කිරීම අවධාරණය ලෙස හඳුන්වයි.**





H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

## ඒකාග්‍රත්වය

නිවසෙහි කිසියම් ස්ථානයක ගෘහ භාණ්ඩ හා උපාංග තැන්පත් කිරීමේ දී ප්‍රමාණයෙන්, හැඩයෙන්, වර්ණයෙන් සහ වයනයෙන් එකිනෙකට ගැළපීම ඒකාග්‍රත්වය ලෙස හඳුන්වයි.





H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# ගෙවත්ත අලංකරණය කිරීම

**ගෙවත්ත අලංකරණයේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.**

- සීමා මායිම් පවත්වා ගැනීම
- පාංශු සංරක්ෂණය සඳහා පියවර ගැනීම
- ජලය බැසයාම සඳහා උපක්‍රම යෙදීම
- අලංකරණය ඇති කිරීමේ විවිධ ක්‍රම යොදා ගැනීම





H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# සීමා මායිම් පවත්වා ගැනීම











H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# පාංශු සංරක්ෂණය සඳහා පියවර ගැනීම



කාණු පද්ධතිය සකස් කිරීම



ගල් වැටි යෙදීම



පඳුරු ශාක වැවීම





H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# ජලය බැස යාමේ උපක්‍රම යෙදීම





H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE

# අලංකාරය ඇති කිරීමේ විවිධ ක්‍රම







H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE





H.TEKLA HEMAMALI
MINU/PRESIDENT'S
COLLEGE